දේශයේ අපේක්ෂාව

# අනුර



දිනන
රටක
ගමන

'දේශයේ අපේක්ෂාව' ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් උපුටා ගත් සංක්ෂිප්ත සටහනක්

# සශ්‍රීක දේශයක්

## ආර්ථිකය

ආදායම් බෙදීයාමේ විෂමතාවයන් අවම කරමින් ආර්ථික ප්‍රතිලාභ සාධාරණ ලෙස මහජනතාවට ලැබෙන අඛණ්ඩ තිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා ස්ථායී වර්ධන අනුපාතයක් ගෙන එන ආර්ථික තුලිතභාවය අපේ ඉලක්කයයි.

- දේශීය සම්පත් උපයෝගී කරගනිමින් භාණ්ඩ නිෂ්පාදනය සඳහා සෑම දිස්ත්‍රික්කයකම ආවරණය වන පරිදි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා 100ක් පිහිටුවීම.
- අපනයන භෝග විවිධාංගීකරණය සඳහා කෘෂි නිෂ්පාදන ගම්මාන 100ක් පිහිටුවීම.
- කෘෂිකර්මාන්තයට අවශ්‍ය වන සුළු උපකරණ දේශීයව නිපදවීම සඳහා සෑම දිස්ත්‍රික්කයකටම එක් කර්මාන්ත ශාලාවක් බිහි කිරීම.
- ගම් මට්ටමින් පොකුරු කාන්තා ව්‍යවසායිකාවන් 15,000ක් බිහි කිරීම.
- පැය 24 පුරාම විවෘත මහා පරිමාණ වෙළෙඳ හා හුවමාරු මධ්‍යස්ථාන සෑම දිස්ත්‍රික්කයකම ආරම්භ කිරීම.
- වසර පහක් ඇතුළත තොරතුරු තාක්ෂණ මෘදුකාංග හා ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ නව සමාගම් 2,000ක් ඇති කිරීම.
- කෘෂිකාර්මික හෝ ව්‍යාපාරික කටයුතු සඳහා රාජ්‍ය බැංකුවලින් ණය ලබාගෙන ගෙවීමට නොහැකි වූ සුළු පරිමාණ ණය විධිමත් විමර්ශනයකින් පසු කපාහැරීම.
- සරල බදු ක්‍රමයක් හඳුන්වා දීම සඳහා ආදායම් බදු පනත සංශෝධනයට ලක් කිරීම.
- ක්ෂුද්‍ර ණය උගුලේ හිරවී සිටින ග්‍රාමීය ජනතාවගේ ණය පොලී රහිතව රජයෙන් ගෙවා ඔවුන් ඵලදායී ව්‍යවසායන්හි යෙදීමට අවශ්‍ය මඟ පෙන්වීම හා ප්‍රාග්ධනය ලබාදීම.
- සමෘද්ධිලාභී පවුල්වල අ.පො.ස. (උ.පෙ.) සමතුන්ට හා උපාධිධාරීන්ට රැකියා ලබාදීම හෝ ව්‍යවසායකත්ව යෝජනා ක්‍රම මගින් ස්ථිර ආදායමක් සහතික කිරීම.
- පහළම ආදායම් ලබන පවුල් ලක්ෂ හය ආර්ථික වශයෙන් ශක්තිමත් කෙරෙන තෙක් ඔවුන්ගේ සමෘද්ධි දීමනාව රුපියල් 10,000 දක්වා ඉහළ දැමීම.
- පරිසර හිතකාමී හා සංස්කෘතිකමය වැදගත් ස්ථාන ආශ්‍රිතව ප්‍රජා කේන්ද්‍ර සංචාරක ගම්මාන 200ක් බිහිකිරීම.
- විදේශ ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට මුදල් එවන විට අයකරන සියලු බදු ඉවත් කර ඔවුන් සඳහා සහනදායී ගෙවීම් ක්‍රම මත නිවසක් ඉදිකර දීම.

## කෘෂිකර්මාන්තය

- එක් එක් කන්නය සඳහා ඒ ඒ ගොවියා වගා කළ යුතු භෝගය, අදාළ භෝග ප්‍රභේදය, අවශ්‍ය භූමි ප්‍රමාණය, පිරිවැය සහ අපේක්ෂිත වෙළඳ මිල ආදිය ඇතුළත් ජාතික කෘෂි සැලැස්මක් සැකසීම.
- නවීන තාක්ෂණය හා යන්ත්‍ර උපයෝගී කර ගැනීම පහසු කිරීමට ඒකාබද්ධ ගොවිබිම් ඇති කිරීම.
- රජයේ හා පෞද්ගලික හිමිකරුවන් සතු යන්ත්‍රෝපකරණ ඒකාබද්ධ කරන සංචිතයක් ඇති කිරීම.
- කෘෂි යන්ත්‍රෝපකරණ ආනයනයේදී සහ අලෙවියේදී බදුවලින් නිදහස් කිරීම.
- නිෂ්පාදනය ඉලක්ක වූ පොහොර සහනාධාර ක්‍රමයක් සකස් කිරීම.
- කෘෂිකාර්මික ණය හා අනෙකුත් මූල්‍ය සේවාවන් පහසුකම් සැලසීමට කෘෂිකාර්මික බැංකුවක් බිහි කිරීම.
- වසර 4ක් තුළ නූතන කෘෂිකර්මාන්තයට අවශ්‍ය කෘෂි වෘත්තිකයන් 100,000ක් පුහුණු කිරීම.
- සම්බා වී කිලෝ එකක් සඳහා රුපියල් 60ක් හා නාඩු වී සඳහා රු. 50ක අවම සහතික මිලක් නිර්දේශ කිරීම.
- අක්කරයකට වී බුසල් 120 ඉක්මවා අස්වනු ලැබීමේදී වැඩිවූ සෑම වී බුසලක් සඳහාම රු.1,000ක දිරි දීමනාවක් ගොවියාට ගෙවීම.
- කෘෂි අපනයන නිෂ්පාදන අගය එකතු කිරීමේ කර්මාන්ත ශාලා 50ක් බිහි කිරීම.
- වසර 3ක් තුළ කෘෂි අපනයන ගම්මාන 200ක් ස්ථාපිත කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට නවීන තාක්ෂණය යොදා ගැනීම සඳහා සහන පොලී මත බැංකු ණය ලබාදීම.
- ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව දිරිමත් කිරීම සඳහා පොලී රහිත ණය ලබාදීම.
- කාබනික හා ඖෂධීය සහල් නිෂ්පාදනය සඳහා අක්කර 20,000ක් වෙන් කිරීම.
- ඖෂධීය වගාවන් සඳහා අක්කර 3,000ක් වෙන් කිරීම.
- රජයේ බීජ ගොවිපොළ හා ගොවි ගම්මාන නවීකරණය කොට පුළුල් කිරීම.

## ධීවර හා ජලජ සම්පත් කර්මාන්තය

- උසස් තාක්ෂණයෙන් යුත් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ඉදිකිරීම.
- සෑම ප්‍රධාන ධීවර වරායක් ආශ්‍රිතවම මත්ස්‍ය පසු අස්වනු සැකසුම් කර්මාන්ත පිහිටුවීම සහ ශීතාගාර ඉදිකිරීම.
- ධීවර ප්‍රජාව ඇතුළු නිෂ්පාදන කර්මාන්තයන්ට දායක වන ප්‍රජාව සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.
- ධීවර ගම්මාන ආශ්‍රිතව වෛද්‍ය මධ්‍යස්ථාන, සායන, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වැනි කායික හා මානසික සෞඛ්‍ය යහපැවැත්මට අවශ්‍ය පහසුකම් සැලසීම.
- සෑම ධීවර පවුලක් සඳහාම පහසුකම් සහිත ධීවර නිවාස ලබාදීම.

## ප්‍රවාහනය

- සියලුම දුම්රිය මාර්ග නවීකරණය කිරීම.
- ප්‍රධාන දුම්රිය මාර්ග සියල්ලටම මංතීරු දෙකේ මාර්ග හා ප්‍රධාන නගර ආශ්‍රිතව මංතීරු තුනේ මාර්ගද එක්කරමින් ලංකාවේ සෑම ප්‍රධාන නගරයක්ම එකිනෙක යා කෙරෙන දුම්රිය මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම.
- මඟී ප්‍රවාහන සහ අන්තර් පළාත් මඟී ප්‍රවාහනයට රාජ්‍ය - පෞද්ගලික මහජන බස් සමාගමක් ස්ථාපිත කිරීම.
- පොදු මඟී ප්‍රවාහන සේවා බදුවලින් නිදහස් කිරීම.
- මඟී ගමනාගමනයට බස් රථ මිලදී ගැනීමට අඩු පොලී ණය ලබාදීම.
- රාත්‍රී කාලයේදී සහ මගීන් ප්‍රමාණය අඩු කලාපයන්හි පොදු ප්‍රවාහනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බදු සහන සහ අවශ්‍ය අවස්ථාවන්හිදී දිරි දීමනා ලබාදීම.
- දුර ගමන් බස් නැවතුම් ආසන්නයේ පෞද්ගලික වාහන නැවතුම් පහසුකම් ඇති කිරීම.
- පොදු ප්‍රවාහන සේවාවන් භාවිත කරන කාන්තාවන් සහ ළමුන් මුහුණ දෙන විවිධ අතවර වැළැක්වීම.
- දුර ගමන් සේවාවන්හි නැවතුම් ස්ථානවල පිරිසිදු වැසිකිළි පහසුකම් හා පිරිසිදු ආහාර සපයන සේවාවන් ජාලයක් ඇති කිරීම.

දේශයේ අපේක්ෂාව | අනුර කුමාර දිසානායක

# සබුද්ධික දේශයක්

## අධ්‍යාපනය

පුද්ගලයන් සතු විභවතාවන් හා හැකියාවන් ඉස්මතු කරමින් සමාජ සංවර්ධනයට සක්‍රීයව දායක විය හැකි සමබර පෞරුෂයක් සහිත ශිෂ්ට සම්පන්න මානව සම්පතක් බිහිකිරීම මෙම අධ්‍යාපන ප්‍රතිපත්තියේ අරමුණයි.

- පූර්ව ළමාවිය සංවර්ධනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා රජය මගින් සම්පූර්ණයෙන් නොමිලේ අධ්‍යාපනය ලබාදීම.
- සෑම දරුවකුටම සිය නිවසේ සිට හෝ මවුපියන්ගේ සේවා ස්ථානයේ සිට කි.මී. 02ක් ඇතුළත ප්‍රමිතියෙන් යුත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
- සුදුසුකම් සහිත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් සහ ගුරුභවතුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම.
- මව් භාෂාවට අමතරව අනෙක් ජාතික භාෂා සහ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම.
- ජාතික සමගියට සක්‍රීයව දායක කරගන්නා ලෙස පාසල් තුළ බහු ආගමික, බහුවාර්ගික හා බහු සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම.
- සෑම දරුවකුටම නොමිලේ පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාදීම.
- සියලුම දරුවන්ට වසර 13ක අනිවාර්ය ශාස්ත්‍රීය හෝ වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම.
- සෑම පාසල් ශිෂ්‍යයෙකුටම සිය නිවසේ සිට හෝ මවුපියන්ගේ සේවා ස්ථානයේ සිට කි.මී. 04ක් ඇතුළත සියලු පහසුකම් සහිත ප්‍රාථමික පාසලක් ලබාදීම.
- පීඩාකාරී විභාග ඉලක්ක අධ්‍යාපනය වෙනුවට ළමුන්ගේ පෞද්ගලික කුසලතා ඇගයීම් ක්‍රම සහිත අධ්‍යාපන මිනුම් ක්‍රමවේදයක් නිර්මාණය කිරීම.
- නවය වසර අවසානයේදී තෝරාගත් ප්‍රධාන විෂයයන් සඳහා ජාතික මට්ටමින් පවත්වනු ලබන විභාගයකින් පසු සියලු ළමුන් ශාස්ත්‍රීය හෝ වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම.
- අ.පො.ස. (සා./පෙ.) සහ අ.පො.ස. (උ./පෙ.) විභාගවල ප්‍රතිඵල මසක් ඇතුළත ලබාදීම.
- ගුරු අභ්‍යාස විද්‍යාල සහ අධ්‍යාපන විද්‍යා පීඨ උපාධි ප්‍රදාන ආයතන ලෙසට උසස් කිරීම.
- ශ්‍රී ලංකාවේ ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට ගුරු වෘත්තිය ඇතුළත් කිරීම.
- අ.පො.ස. (උ.පෙ.) ප්‍රතිඵල නිකුත් වී මාස 3ක් ඇතුළත විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාදීම.
- විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සඳහා නව විශ්වවිද්‍යාල පද්ධතියක් ඇති කිරීම.
- සෑම පුරවැසියකුටම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මෙන්ම මූලික නීතිය, තොරතුරු තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම.
- උසස් අධ්‍යාපන ආයතනවල සිදුවන හිංසනය වැළැක්වීමේ ගුරු සිසු පරිපාලන ඒකාබද්ධ ව්‍යුහයක් පිහිටුවීම.
- පාසල් හා උසස් අධ්‍යාපනික ආයතනවල සිසුන් මත්ද්‍රව්‍යවලට ගොදුරු කරගැනීම වැළැක්වීම.

## තොරතුරු සන්නිවේදන තාක්ෂණය

සබුද්ධික ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා වන උසස් මානව සම්පත මනා තොරතුරු තාක්ෂණ නිපුණතාවක් සහිත ප්‍රජාවක් බවට පත් කරවීම සහ ලොව තොරතුරු තාක්ෂණ විසඳුම් සැපයීමේ ප්‍රමුඛයා බවට ශ්‍රී ලංකාව පත් කිරීම අපේ අරමුණ වේ.

- තොරතුරු තාක්ෂණය නව විෂය නිර්දේශ හා ක්‍රමවේද අධ්‍යාපන පද්ධතිය තුළ ස්ථාපිත කිරීම.
- ව්‍යාපාරික ස්ථාන, පර්යේෂණ, උපකරණ, මධ්‍යස්ථාන සහ වේගවත් අන්තර්ජාල සම්බන්ධතා වැනි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම.
- ඉදිරි වසර පහ තුළ ප්‍රමුඛ විදේශ ආදායම් මාර්ගයක් බවට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පත් කිරීම.
- වසර 5ක් තුළ 5G තාක්ෂණය ස්ථාපිත කිරීම සදහා යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- තොරතුරු තාක්ෂණය අධ්‍යාපනය පූර්ව ළමාවියේ සිට දරුවාට ලබා දෙන අතර අවිධිමත් අධ්‍යාපනය උපයෝගී කරගෙන වැඩිහිටි ප්‍රජාවට ඒ දැනුම ලබාදීම.
- ශ්‍රී ලංකාව විසින් නිර්මාණය කළ ලොව පළමු ආපදා කළමනාකරණ පද්ධති 2 ලොව කාර්යක්ෂම ආපදා කළමනාකරණ පද්ධති බවට පත්කිරීම.
- තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍රයේ ගුණාත්මක, විශ්වාසදායකම හා නවීනතම විසඳුම් සපයන සන්නාමය බවට ශ්‍රී ලංකාව පත්කිරීම.



අධ්‍යාපනය යනු පවත්නා දැනුම ලබාගැනීමත් එම දැනුම සන්නිවේදනය කිරීමත් එමෙන්ම නව දැනුම නිෂ්පාදනයත් අන්තර්ගත වූ ක්‍රියාවලියක්. එම නිසා පුද්ගලයෙකු අධ්‍යාපනය තුළින් ලබාගන්නා සියලු සංවර්ධනයන් පවතින සියලු සංස්කෘතීන්ට ඉමහත් දායකත්වයක් දක්වනවා. එමෙන්ම අධ්‍යාපනය වෙනුවෙන් සමාජය විසින් දරන පිරිවැය ඉහළ අගයක්. ඒ අනුව මේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් වනුයේ සමාජයට වගවන පුරවැසියන් බිහිකිරීම අරමුණු කරගෙනයි.

**මහාචාර්ය රාහුල අතලගේ මහතා**

*මොරටුව විශ්වවිද්‍යාලයේ හිටපු නියෝජ්‍ය උපකුළපති හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ පශ්චාත් උපාධි හා පර්යේෂණ අධ්‍යයන පීඨයේ පීඨාධිපති*

දේශයේ අපේක්ෂාව | අනුර කුමාර දිසානායක

# සංතෘප්තිමත් දේශයක්

## සෞඛ්‍යය

රටකට අවශ්‍ය වන්නේ, ගුණාත්මක සෞඛ්‍ය සේවයක් සහ නිරෝගී පුරවැසියෙකි. ඒ සඳහා ප්‍රතිකාර කිරීමට වඩා රෝග නිවාරණය අරමුණු කරගත් නිරෝගී දිවි පැවැත්මක් ජනතාව වෙත ලබාදීම අපේ ඉලක්කයයි.

- වසරක් ඇතුළත රෝගීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක්, රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී පිළිපැදිය යුතු සායනික මාර්ගෝපදේශන සංග්‍රහයක් නීතිගත කිරීම.
- මිල අඩු ප්‍රමිතිගත ඖෂධ පමණක් ලබාදීම සඳහා වසර දෙකක් තුළ සියලු පහසුකම් සහිත නවීන රසායනාගාරයක් බිහිකිරීම.
- සෑම පවුලක් සඳහාම වගකියන පවුලේ වෛද්‍යවරයෙක් සහ කාර්යමණ්ඩලයක් පත් කිරීම.
- බටහිර, ආයුර්වේද, හෝමියෝපති, සිද්ධ, යුනානි හා දේශීය වෛද්‍ය ක්‍රම විද්‍යාත්මක පදනමක් මත එක්කරන ඒකාබද්ධ සේවාවක් සකස් කිරීම.
- රජයේ රෝහල්වල බාහිර සායන ප්‍රතිකාර, රසායනාගාර සහ අනෙකුත් මූලික සේවා සතියේ සෑම දිනකම උදෑසන 8.00 සිට රාත්‍රී 8.00 දක්වා විවෘත කිරීම.
- රජයේ රෝහලේ සායනික වෛද්‍යවරු හමුවීම සඳහා වේලාව වෙන් කර ගැනීමට පොදු අංකයක් සහිත දුරකථන සේවාවක් හඳුන්වා දීම.
- නේවාසික සෑම රෝගියකු සඳහාම ඇඳක් ලැබීම හිමිකමක් සේ නීතිගත කිරීම.
- වයස අවුරුදු 40ට වැඩි සෑම පුරවැසියකුම වසරකට වරක් නොමිලේ පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට ලක් කිරීම.

## සංස්කෘතිය

මානව විමුක්තිය පිණිස සංස්කෘතිය අලුතින් නිර්මාණය කිරීම උදෙසා ආවේශය සහ නිර්මාණ ශක්තිය ඇත්තා වූ සංස්කෘතිකවත් පුරවැසියෙකු නිර්මාණය කිරීම, සෑම මනුෂ්‍යයෙකුගේම අයිතීන් සහ අභිමානය සුරකින සාමකාමී සහජීවනීය රටක් නිර්මාණය කිරීම අපේ අරමුණයි.

- අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සංස්කෘතික පුරවැසියෙකු ගොඩනැගීමේ පදනම දැමීම සඳහා පාසල් ගුරු විද්‍යාල සහ විශ්වවිද්‍යාල ඇසුරු කරගෙන සංස්කෘතිකවත් භාව සංවර්ධනය කිරීමට විවිධ වැඩසටහන් දියත් කිරීම.
- ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය ජාලා භාවිත කර පොත-පත කියවීම කලා රසවින්දනය පිළිබඳ මහජන අවකාශයෙහි කතිකාව සංස්කෘතිකවත් පුරවැසියෙකු නිර්මාණය කිරීමට යොදාගැනීම.
- ශක්තිමත් බුද්ධිමය දේපළ පනතක් ඇතිකොට කලාකරුවාගේ නිර්මාණ අයිතිය තහවුරු කිරීම.
- සියලු කලා ක්ෂේත්‍රවල ප්‍රවීණයන් සහ විශ්‍රාමිකයන්ගේ සුබසාධනය පිණිස ස්ථිර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- සාහිත්‍යයෙහි වර්ධනයට අවශ්‍ය ද්‍රව්‍යමය පහසුකම් සපයා දීම සඳහා කඩදාසි සහ අනෙකුත් මුද්‍රණ අමුද්‍රව්‍ය බදුවලින් නිදහස් කිරීම.
- නාට්‍ය නිෂ්පාදනය සහ ප්‍රදර්ශනය සඳහා මූල්‍ය ආධාර ලබාදීම.
- නාට්‍ය නිෂ්පාදනය හා ප්‍රදර්ශනය ආශ්‍රිත බදු අඩු කිරීම.
- ශ්‍රී ලංකාව පුරා විසිර ඇති සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- සෑම සිනමා කෘතියක්ම බෙදා හැරීමේදී සාධාරණ අනුපිළිවෙළ අනුගමනය කිරීම.
- සමකාලීන නිර්මාණකරුවන්ගේ පර්යේෂණ සඳහා නවීන කලාගාරයක් නිර්මාණය කිරීම.

## නිවාස

- අවුරුදු 5ක් තුළ සෑම පවුලකටම සියලු පහසුකම් සහිත නිවාසයක් ලබා දීම.
- දැනට ඇති පොල් අතු හා තල් අතු සෙවිලිකළ නිවෙස් 45,000ක් ස්ථිර නිවාස බවට පත්කිරීම.
- සියලු වතු කම්කරුවන් සඳහා ස්ථිර හා පහසුකම් සහිත මහල් නිවාස ලබාදීම
- යුද්ධය නිසා පූර්ණ හා අර්ධ ලෙස හානියට පත්වී ඇති නිවාස දෙලක්ෂ විසිදහසක් ඉක්මනින් ප්‍රතිසංස්කරණය කිරීම.
- අඩු ආදායම්ලාභී ජනතාවට පොලී රහිත දිගුකාලීන ණය පදනම යටතේ නිවාස ලබාදෙන වැඩපිළිවෙලක් සැකසීම.

## ක්‍රීඩා

- ජාතික ක්‍රීඩා සංගම්, ජාතික ඔලිම්පික් කමිටුව මෙන්ම ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ පූර්ණ බලැති අණදෙන්නා වන ක්‍රීඩා අමාත්‍යංශයද එක ප්‍රතිපත්ති රාමුවක් යටතට ගැනීම.
- සෑම දිස්ත්‍රික්කයක් සඳහාම සියලු යටිතල පහසුකම්වලින් යුත් එක් ක්‍රීඩා පාසලක් සහ ක්‍රීඩා සංකීර්ණයක් ඇති කිරීම.
- ජාතික ක්‍රීඩා විද්‍යායතනය ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් දක්වා දියුණු කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වූ ක්‍රීඩාවන් ව්‍යාප්ත කරමින් ඔවුන්ද ජාතික ක්‍රීඩා සංවර්ධනයේ කොටස්කරුවන් කරගනු ලැබීම.



ලෝකයක් රටක් වෙනස් කරන්නනම් සංස්කෘතික ජීවිතය ගැන තියෙන කම්පාව සහ කලකිරීම විතරක් ප්‍රමාණවත් වෙන්නෙ නැහැ. එය වෙනස් කරන්න ඕනෑ. ඒත් කවුද ඒක වෙනස් කරන්නේ? ඒක වෙනස් කරන්න කවුරුවත් අහසින් පාත් වෙන්නෙ නැහැ. ඒක අපි හැමෝගෙම සාමූහික උත්සාහයක් විය යුතුයි. මේ ප්‍රතිපත්තිවල අරමුණ වන්නේ එයයි.

**මහාචාර්ය ලියනගේ අමරකීර්ති මහතා**

*පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශය*

දේශයේ අපේක්ෂාව | අනුර කුමාර දිසානායක

# සදාහරිත දේශයක්

## පරිසරය

ගෞරවනීය මානව ජීවිතයක් ගෙවීමට අවශ්‍ය පවිත්‍ර වාසස්ථානයක් හා සේවා ස්ථානයක් නිර්මාණය කිරීමත් රටක් ලෙස පිවිතුරු සුන්දර පරිසරයක් නිර්මාණය කිරීමත් අපගේ ප්‍රතිපත්තියයි.

- ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සහ පරිසරය අතර සමතුලිතතාව රැකෙන පරිදි ස්වභාවික සම්පත් හා පරිසර කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් ඉදිකිරීම්වලදී සිදුවන පාංශු ඛාදනය වැළැක්වීමට එම ව්‍යාපෘති සැලසුම් කිරීමේදී නව රීතීන් හා කොන්දේසි පැනවීම.
- මතුපිට හා භූ අභ්‍යන්තර ජල දූෂණයට හේතුකාරක වන සාධක නවතා දැමීම හා ඉවත් කිරීම.
- වෙරළ කලාපයේ අධි සංවේදී පරිසර පද්ධති හඳුනාගෙන එම පරිසර පද්ධති සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය අවම සීමාව තුළ මානව ක්‍රියාකාරකම් අත්හිටුවීම.
- වන සතුන් ගම් වැදීම හා වගා බිම්වලට සිදු කරන හානීන් වළක්වා ගැනීම අරමුණු කරගනිමින් වන අලින් හා වන සතුන් සඳහා වනාන්තරවල ආහාර අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

# ආරක්ෂිත දේශයක්

## විදේශ ප්‍රතිපත්තිය

ගෝලීයකරණය සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන හා දේශපාලන මැදිහත්වීම අතිශය තීව්‍ර යුගයකදී අපගේ විදේශ ප්‍රතිපත්තියේ පුළුල් අරමුණ වන්නේ ස්වාධීන වූ, ජාතික ජනතා අභිලාෂයන් මෙහෙයවන, ජාත්‍යන්තර සාමය හා සහජීවනයට අනුග්‍රහයක් වන සේම අපගේ රටේ ශක්‍යතා ඔප්නංවන හා ගෝලීය අවකාශය තුළ පිළිගැනීමට බඳුන් වන ලොව විශිෂ්ට රාජ්‍යයක් නිර්මාණය කර ගැනීමය.

- කිසිදු රාජ්‍යයකට ගැති නොවී රටේ ස්වාධීනත්වය සුරකින නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- පරාජිත මහජන නියෝජිතයින් හා දේශපාලන පක්ෂවල නිලධාරීන් තානාපතිවරුන් ලෙස පත්කිරීම අහෝසි කිරීම.
- තානාපති සේවයට යාමට පෙර තානාපති ඇතුළු සියලු නිලධාරීන් මාස 06ක පුහුණුවකට යටත්විය යුතු අතර ඉංග්‍රීසි ඇතුළුව ජර්මන්, ප්‍රංශ සහ චීන යන භාෂාවලින් එක් භාෂාවක් හා ජාත්‍යන්තර කටයුතු සඳහා පුහුණුවක් ලබා දීම.

## ජාතික ආරක්ෂාව

ජාතික ආරක්ෂාව යනු බාහිර යුදමය හා අනෙකුත් උපායමාර්ගික මැදිහත්වීම්වලට එරෙහිව පියවර ගනිමින් රටේ ස්වෛරීත්වය ආරක්ෂා කිරීමත් අභ්‍යන්තර ගැටුම්වලට ඉඩ නොතබමින් මහජනයා එහි ගොදුරු බවට පත්වීමට ඉඩ නොතබමින් පුරවැසියාගේ ආරක්ෂාව තහවුරු කිරීම අපේ අරමුණයි.

- යුදමය ආර්ථික හා අනෙකුත් උපක්‍රමික විදේශීය මැදිහත්වීම්වලට එරෙහිව කටයුතු කරමින් රටේ ස්වෛරීත්වය ආරක්ෂා කිරීම.
- ජාතික හා මහජන ආරක්ෂාවට අදාළ සියලු රාජ්‍ය යාන්ත්‍රණයන් මහජනයාට වගකියන ආයතන බවට පරිවර්තනය කිරීම.
- රටේ ස්වභාවික සම්පත් හෝ භූමිය කිසිදු අයුරකින් විදේශීය රටකට හෝ ආයතනයකට පැවරීමෙන් හෝ දීර්ඝකාලීන බදු දීමෙන් වැළකීම.
- පොලිසිය හා සියලුම ආරක්ෂක හමුදා දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම වළක්වාලමින් ඒවායේ ස්වාධීනත්වය තහවුරු කිරීම
- රාජ්‍ය ආරක්ෂාවට එරෙහිව සිදුවන බාහිර හා අභ්‍යන්තර යුදමය, දේශපාලනමය, ආර්ථිකමය, සංස්කෘතිකමය තර්ජනයන් සහ පීඩනයන්ට මුහුණ දීමට හා ඒවා ජය ගැනීමට අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික යාන්ත්‍රණයක් හා ගැටුම් නිරාකරණ ක්‍රියාවලියක් අඛණ්ඩව පවත්වා ගැනීම.
- ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම, මිනිස් ජාවාරම සහ අනෙකුත් නීතිවිරෝධී කටයුතු මැඩපැවැත්වීමට අවශ්‍ය නීති පද්ධතිය ශක්තිමත් කිරීම.
- ත්‍රිවිධ හමුදාව හා පොලිසිය නිර්දේශපාලනික කිරීම සහ ආරක්ෂක සේවය කාර්යක්ෂම කිරීමට අවශ්‍ය නව තාක්ෂණයන් හඳුන්වාදීම.
- රාජ්‍ය ආරක්ෂාව සහ සාමය ආරක්ෂා කරන සියලුම සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල ජීවන තත්වයන් උසස් කිරීමට අවශ්‍ය නිවාස, සෞඛ්‍ය සහ අනෙකුත් යටිතල පහසුකම් සම්පාදනය.



අපි අපේ පරිසර ප්‍රතිපත්තිය සකස් කරද්දී දිස්ත්‍රික්ක ගණනාවක ඇවිදලා එම දිස්ත්‍රික්කවල ජීවත්වන සාමාන්‍ය ජනයාගේද අදහස් අරගත්තා. ඒක අපට අලුත් හා නවමු අත්දැකීමක් වුණා. එක එක ව්‍යාපෘති සඳහා ඉඩම් අත්කර ගැනීමේදී ඉන් පරිසරයට වන බලපෑම දිස්ත්‍රික් ගණනාවක ගොස් අප අධ්‍යයනය කළා. මෙම පරිසර ප්‍රතිපත්තිය අප සකස් කළේ එම විෂය ගැන ප්‍රවීණ විද්වතුන් රැසකගේද සහභාගිත්වයෙන්.

**ආචාර්ය ශම්මික ලියනගේ මහතා**

*රුහුණු විශ්වවිද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය*

# සුරක්ෂිත දේශයක්

## ගාමක බලවේගයක් ලෙස ස්ත්‍රිය

සියල්ලන්ටම නිදහස සහ සමානාත්මතාව තහවුරු වූ, හිංසනයෙන් හා පීඩාවන්ගෙන් තොරව ජීවත් විය හැකි සමාජයක් ඇති කිරීම සඳහා ස්ත්‍රී සහභාගීත්වය තහවුරු කිරීම

- ශ්‍රම බලකායට ස්ත්‍රීන්ගේ දායකත්වය ලබා ගැනීමට පවතින බාධා ඉවත් කිරීමත් දරුවන් බිහිකිරීම සහ හදාවඩාගැනීමත් සමාජ වගකීමක් ලෙස සලකා ඒ අනුව එම අදාළ භූමිකා පවත්වාගෙන යාමට පහසුකම් සැලසීම.
- රටට විදේශ විනිමය සපයා දෙන්නවුන් ලෙස ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට අවශ්‍ය රැකවරණය සහ පහසුකම් සැලසීම
- විවාහ සහ දික්කසාද නීති පුද්ගල අයිතිවාසිකම් තහවුරු වන අයුරින් සංශෝධනය කිරීම.
- දෑවැද්ද වැනි පාරම්පරික යල්පිනූ ආකල්ප නිසා පීඩාවට සහ හිංසනයට ලක් වීම නැවැත්වීම සඳහා නීති සකස් කිරීම.
- ලිංගික අපයෝජන සම්බන්ධව පවත්නා නීතියේ අඩුලුහුඬුතා ඉවත් කර පුනරුත්ථාපන හා ආරක්ෂණය කාර්යක්ෂම කිරීම.
- ස්ත්‍රී ගෘහමූලිකයන්ගේ ඉඩම් අයිතිය තහවුරු වන ලෙස නීති සංශෝධනය කිරීම.

## දේශයේ අනාගතය සහ ළමා පරපුර

- ළමයින් පිළිබඳ රාජ්‍ය ආයතන තුළ වගකීම ශක්තිමත් කිරීම.
- හිංසනය, නොසලකා හැරීම, ප්‍රචණ්ඩත්වය සහ නීතිය සමඟ ගැටීමට හසුවන ළමුන් පවුල සහ ප්‍රජාව තුළ රැක බලා ගැනීමේ ව්‍යුහයන් ශක්තිමත් කිරීමට පියවර ගැනීම.
- විවිධ හේතූන් මත නීතිය සමඟ ගැටෙන හෝ නීතිය ඉදිරියට එන ළමුන් සඳහා නීතිමය රැකවරණය ලබාදීම.

## යෞවනත්වය සහ සමාජ ප්‍රගමනය


- තරුණ තරුණියන්ගේ ජාත්‍යන්තර භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනයට රාත්‍රී පාසැල් ඇති කිරීම.
- අධ්‍යාපන ක්‍රියාවලිය සම්පූර්ණ නොකළ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීම සඳහා සිව් අවුරුදු සැලැස්මක් සැකසීම.
- තරුණ ව්‍යවසායකයන්ට ස්වයං රැකියා ව්‍යාපෘතීන්ට අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබාදෙන වෙනම තරුණ බැංකුවක් (Youth Development Bank) ඇති කිරීම.
- අධ්‍යාපන කටයුතු සයිබර් අවකාශය මගින් සිදුකිරීමට වසර 5ක ඩිජිටල් අධ්‍යාපන වැඩසටහන් (Digital Education Programmes ) සකස් කිරීම
- සියලුම ක්ෂේත්‍රවල තරුණ නව නිර්මාණකරුවන් දිරිමත් කිරීමේ වැඩපිළිවෙලක් සැකසීම.
- තරුණ ප්‍රශ්න වෙනුවෙන් මැදිහත් වන දුක්ගන්නාරාළ (Ombudsman) කෙනෙකු පත් කිරීම.

## ජ්‍යෙෂ්ඨ පුරවැසි හිමිකම

- නිවෙස් තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමේ කටයුතු කරන අවස්ථාවල ඊට අවශ්‍ය මූලික පහසුකම් නොමිලේ සැපයීම.
- නිවෙස් තුළ සිටින වැඩිහිටියන්ගේ සෞඛ්‍ය කටයුතු මාසිකව සොයා බැලීම සඳහා සෞඛ්‍ය කණ්ඩායම් යෙදවීම.
- වැඩිහිටි සුරැකීමේ මධ්‍යස්ථානවල තිබිය යුතු අවම පහසුකම් නිර්ණය කොට සෑම පළාත් පාලන බල ප්‍රදේශයකම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල සැකසුණු වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන 02ක් පිහිටුවීම.
- සියලු වැඩිහිටියන්ට රැකවරණය ලැබෙන රක්ෂණාවරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදලක් ස්ථාපිත කිරීම.
- දුෂ්කරතා ඇති වැඩිහිටි අය සඳහා ජීවන අංකයට සරිලන මූල්‍ය දීමනාවක් ලබාදීම.

## සමරිසි ප්‍රජාව

- ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 A වගන්ති සමරිසි ප්‍රජාවට අදාළ නොවන පරිදි සංශෝධනය කොට ඒවා වැඩිහිටි තැනැත්තන් අතර ස්වකැමැත්තෙන් පෞද්ගලික අවකාශයේ සිදුවන ලිංගික ක්‍රියාවන් ලෙස පිළිගැනීම.
- සමරිසි ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට සහ එම ප්‍රජාවගේ දුක් ගැනවිලි ආමන්ත්‍රණය කළ හැකි නිසි බලයලත් ලේකම් කාර්යාලයක් පිහිටුවීම.



ලංකාවේ විචිත්‍රත්වය තමයි ජාතිකත්ව විවිධත්වය. ඒක පදනම විදිහට තියාගෙන තමයි මේ ප්‍රතිපත්ති මාලාව සකස් කර තියෙන්නෙ. මේ දක්වා බලයට පත් වුණ පාලකයන් තමන්ගේ බලය පවත්වා ගැනීම වෙනුවෙන් මේ විවිධත්වය බෙදා වෙන් කළා. සිංහල දෙමළ ගැටුම් ඇති කළා. අපේ උත්සාහය විවිධත්වය තුළින් ඒකත්වය ගොඩනැගීමයි.

**අශෝක පීරිස් මහතා**

*හිටපු අමාත්‍යාංශ ලේකම් සහ සීමානිර්ණය අභියාචනා කමිටු සභාපති*

# නීතිගරුක දේශයක්

නව ව්‍යවස්ථාවක් මඟින් මූලිකවම ආමන්ත්‍රණය කළ යුතු ක්ෂේත්‍ර වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය, මූලික මිනිස් අයිතීන්, ජන කොටස් අතර සාමය, ආර්ථික සහ සමාජීය අයිතීන් තහවුරු කිරීමත් විවිධ ජාතිකත්වයන්හි අනන්‍යතාවයන් හා සමාන අයිතීන් තහවුරු වන පරිදි ශ්‍රී ලාංකේය ජාතිය නිර්මාණය කිරීම අපේ අරමුණයි.

- විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තුවට වගකියන කැබිනට් මණ්ඩලයක් සහිත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීම.
- කැබිනට් මණ්ඩලය සාමාජිකයින් 25 දෙනෙකුට සීමා කරන අතර ඒ හා සමාන නියෝජ්‍ය ඇමතිවරු හැර වෙනත් කිසිදු ආකාරයේ අමාත්‍යවරු පත් නොකෙරේ.
- ජාතිකත්වයන් අතර අසමගිය සහ ආගමික වෛරය ඇති නොකරන, ස්ත්‍රී පුරුෂභාවය හෝ වෙනත් කරුණු මත වෙනස් කොට නොසැලකීම යන කොන්දේසිවලට යටත්ව භාෂණයේ නිදහස තහවුරු කිරීම.
- ජනතා නියෝජිත ආයතනවල කාන්තා හා තරුණ නියෝජනය අවමය 25% ක් වීම සහතික කිරීම.
- රට පුරා ඇති ජනාධිපති නිල නිවාස අහෝසි කොට එක් නිල නිවසකට පමණක් සීමා කිරීම.
- විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා ඔවුන්ගේ කලත්‍රයන්ට දී ඇති විශ්‍රාම වැටුප් විශේෂ දීමනා හා සියලු වරප්‍රසාද අහෝසි කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදෙන පූර්ණ බදු නිදහස සහිත වාහන බලපත්‍රය අහෝසි කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සැසිවාරයට සහභාගී වීම වෙනුවෙන් ගෙවන දීමනා අහෝසි කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ අමාත්‍ය කාර්ය මණ්ඩලයට වසර 05කින් පසුව ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට හෝ පවුලේ අයට සෘජු හෝ වක්‍ර ලෙස ව්‍යාපාර හෝ කොන්ත්‍රාත් කිරීම තහනම් කිරීම.

## පොලිසිය

- පොලිස් සේවයේ සියලු පත්වීම්, උසස්කිරීම්, ස්ථාන මාරු සඳහා පොලිස් කොමිසමට බලය පැවරීම.
- පොලිස් සේවාව වෘත්තීය පොලිස් සේවාවක් බවට පත්කිරීම.
- පොලිස් විශ්වවිද්‍යාලය ස්ථාපිත කොට සියලු ක්ෂේත්‍ර පිළිබඳව උපාධි පුහුණු පාඨමාලා හැදෑරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දීම.
- වැටුප් හා දීමනා සමස්ත රාජ්‍ය සේවයට සමානුපාතිකව ඉහළ දැමීමටත්, අල්ලස්, දූෂණ, වංචාවන් පොලිස් සේවය තුළින් ඉවත්කිරීම සඳහා විශේෂ විමර්ශන ඒකකය වඩාත් ශක්තිමත්ව පොලිස්, සිවිල්, නීති යන ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් සමන්විතව පිහිටුවීම සඳහා නීති සම්පාදනය කිරීමටත් කටයුතු කිරීම.
- නිවසක හිමිකමක් නොමැති සියලු පොලිස් නිලධාරීන්හට නිවාස ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම.

## ජනමාධ්‍ය නිදහස සහ තොරතුරු

- රාජ්‍ය ජනමාධ්‍ය පොදු මහජන දේපළක් ලෙස සලකා කටයුතු කිරීම.
- ජනමාධ්‍ය ස්වාධීන භාවිතයට ඉඩ සැලසීම.
- ප්‍රකාශනයේ අයිතියත් ජනතාවට නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතියත් සමාන ලෙස තහවුරු කිරීම.
- බලපෑම්වලින් තොරව කටයුතු කළ හැකි වන පරිදි ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතීන් සහ නිදහස තහවුරු කිරීම.
- මාධ්‍ය ආයතනවලට අදාළ භාණ්ඩ සහ සේවා ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- මාධ්‍යවේදීන් සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.
- මාධ්‍යවේදීන් සඳහා උපාධි පාඨමාලා ආරම්භ කිරීම.

## මත්ද්‍රව්‍ය නිවාරණය

- මත්ද්‍රව්‍ය වැරදිවලට දඬුවම් දැඩි කිරීමටත්, ඒ සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමටත් අවශ්‍ය නීති සංශෝධනය කිරීම.
- මත්ද්‍රව්‍ය රට තුළට පැමිණෙන ප්‍රධානම ක්‍රම දෙක වන ගුවන් හා නාවික යන මාර්ග පරීක්ෂා කිරීමට ඇති පහසුකම් වර්ධනය කිරීම, නවීන පරීක්ෂා කිරීමේ උපකරණ හඳුන්වා දීම හා නිලධාරීන් පුහුණු කිරීම.
- අන්තරායක ඖෂධ පාලක මණ්ඩලයේ කාර්යයන් පුළුල් කරමින් පාසල් ළමුන් සහ මවුපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව සිදුකිරීමෙන් අලුතින් ඇබ්බැහි වන පිරිස් අවම කිරීම.
- මත් උවදුර ගම තුළට එන ජාලය පිළිබඳ තොරතුරු එකතු කර විශ්ලේෂණය කර එයට සම්බන්ධ පුද්ගලයන්ට සමාජීය වශයෙන් බලපෑමක් කළ හැකි සංවිධානාත්මක ප්‍රජා මූල කණ්ඩායමක් ගම තුළ ඇතිකිරීම හා අවශ්‍ය පහසුකම් ලබා දෙමින් එය නිසි පරිදි මෙහෙය විය හැකි රාජ්‍ය යාන්ත්‍රණයක් ඇති කිරීම

## ශ්‍රී ලාංකේය ජාතියක්

- සිංහල දෙමළ මුස්ලිම් ඇතුළු සියලු ජාතිකත්වයන්ට සමාන පිළිගැනීමක් සහිත ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීම.
- යුද්ධය හේතුවෙන් ආදායම් උපයන්නා අතුරුදහන් වී ඇති හෝ මිය ගිය පවුල්වලට මාසිකව රුපියල් 20,000ක දීමනාවක් ලබාදීම.
- සියලුම දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම.
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු සියලු ජනතා මර්දනකාරී අණපනත් අහෝසි කිරීම.
- උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පවතින සියලු රජයේ කාර්යාලවලට දෙමළ භාෂාවෙන් කටයුතු කළ හැකි පරිදි නිලධාරීන් පත් කිරීම.
- කඳුකරය ප්‍රමුඛ වැවිලි ක්ෂේත්‍රය තුළ නිරත වුවන්ට අවම දෛනික වැටුප රු.1000ක් හා අමතර ජීවන දීමනා සමඟ නිත්‍යානුකූල නිවෙසක හිමිකම ලබාදීම.
- මෑත කාලයේ මුස්ලිම් ජනයාට එරෙහිව සිදුවී ඇති ප්‍රචණ්ඩ ක්‍රියා හා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සොයාබැලීමට සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවීම.







## අනුර කුමාර දිසානායක

ප්‍රාථමික අධ්‍යාපනය - තඹුත්තේගම ගාමිණී ප්‍රාථමික විද්‍යාලය.

ද්විතීයික අධ්‍යාපනය - තඹුත්තේගම මධ්‍ය මහ විද්‍යාල අ.පො.ස. උ/පෙළ විද්‍යා ගණිත ධාරාවෙන් සමත්වෙයි. තඹුත්තේගම මධ්‍ය මහ විද්‍යාලයෙන් උසස් පෙළ සමත් වී විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගන්නා පළමු ශිෂ්‍යයාය.

උසස් අධ්‍යාපනය - 1995දී කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධියක් ලබාගනී.

දේශපාලනය: 1987දී ඉන්දු ලංකා ගිවිසුම අත්සන් තබන අවස්ථාවේ ශිෂ්‍යයකුව සිටිමින් දේශපාලනයට සම්බන්ධ වන අතර ශිෂ්‍ය අවධියේ සමාජවාදී ශිෂ්‍ය අංශයේ වැඩකටයුතුවලට සම්බන්ධ වෙයි. 1997දී ඔහු සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක ලෙස පත්වෙයි.

1997දී ජවිපෙ මධ්‍යම කාරක සභාවටද පත්වෙන ඔහු 1998දී ජවිපෙ දේශපාලන මණ්ඩලයට තේරී පත්වෙයි.

1998 මධ්‍යම පළාත් මහ ඇමති අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වූ ඔහු 2000 වර්ෂයේදී පළමුවරට පාර්ලිමේන්තුවට පිවිසෙයි.

2001දී පාර්ලිමේන්තුවට පත්වෙන අතර එම වර්ෂයේදී ආණ්ඩුව ලවා පරිවාස වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර ගැනීමට ප්‍රමුඛ වී කටයුතු කරයි.

2004දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩිම මනාප ලබාගනිමින් පාර්ලිමේන්තුවට තේරී පත්වෙයි. සන්ධාන ආණ්ඩුවේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා පශු සම්පත් අමාත්‍යංශයේ අමාත්‍ය ධුරය දරයි.

2008 වර්ෂයේදී පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් නායකයා බවට පත්වෙයි.

2010 මැතිවරණයේදී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත්වෙයි.

2014 පෙබරවාරි මස 02 වැනිදා පැවැති ජවිපෙ 07වන ජාතික සමුළුවේදී එහි නායකත්වයට තේරී පත්වෙයි.

2015 මහමැතිවරණයෙන් කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත්වූ අතර ජ.වි.පෙ. මන්ත්‍රී කණ්ඩායමේ නායකයා ලෙස කටයුතු කරයි.

2015 සැප්තැම්බර් 03 සිට 2018 දෙසැ. 17 දක්වා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කළේය.

පාර්ලිමේන්තුවේ සක්‍රියම මන්ත්‍රීවරයා ලෙස අඛණ්ඩව අවුරුදු 5ක් තේරී පත්විය.

2019 අගෝස්තු 18 වැනි දින ගාලු මුවදොර පිටියේ පැවති ජන රැලියේදී ජාතික ජන බලවේගයේ ජනාධිපති අපේක්ෂකයා ලෙස නම් කෙරෙයි.

අනුර කුමාර දිසානායක
அனுர குமார திசாநாயக்க
**Anura Kumara Dissanayake**

X

**මාලිමාවට ඡන්දයක්!**



අපේ ආර්ථිකය කැඩී, විසිරී ගිහින් තිබෙනවා. නිෂ්පාදනයේ ගුණාත්මක තත්ත්වය පහත වැටී තිබෙනවා. එය මේ වෙනකොට අපි මුහුණ දෙමින් ඉන්න ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට විසඳුමක් මේ යෝජනා කරන ආර්ථික ප්‍රතිපත්තිය තුළ තියෙනවා.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා**
*ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යයන අංශයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය*



කෘෂිකර්ම ප්‍රතිපත්තිය වියුක්ත ප්‍රතිපත්තියක් ලෙස සලකන්න බැහැ. රටේ පොදු ආර්ථික, දේශපාලන ප්‍රතිපත්තිත් එක්ක, ඒක ගැට ගැහෙනවා. අපේ වෙළඳ ප්‍රතිපත්තිය මොකක්ද? අපේ පරිසර ප්‍රතිපත්තිය කුමක්ද? මේවා එක්කත් කෘෂිකර්මාන්තය ගැට ගැහෙනවා.

**මහාචාර්ය**
**එල්. එම්. අබේවික්‍රම මහතා**
*රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානි*



ලංකාවේ විවිධ වර්ගයේ රථ වාහන ලක්ෂ හැත්තෑ තුනක් විතර තියෙනවා. ඒ කියන්නෙ ලංකාවේ ප්‍රවාහන අවශ්‍යතාවයෙන් 46%ක් විසඳගන්නෙ පෞද්ගලික වාහනවලින්. පොදු ප්‍රවාහනයේ දායකත්වය 52%කට අඩු වෙලා තියෙනවා. අපේ ප්‍රවාහන ප්‍රතිපත්තිවල ඉලක්කය වී ඇත්තේ පොදු ප්‍රවාහනය නගා සිටුවීමයි.

**මහාචාර්ය**
**උපාලි පන්නිලගේ මහතා**
*රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති*



මේ වෙනකොට රෝගීන් පිළිබඳ ප්‍රඥප්තියක් ගැන කතාවෙනවා. ඒක අවුරුදු ගාණක් පුරා කතා වෙමින් තියෙනවා. ඒත් ක්‍රියාවට නගන්නෙ නැහැ. අපි ඒ ප්‍රඥප්තිය ක්‍රියාවට නගනවා විතරක් නෙමෙයි, රෝගීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනතක් සම්මත කර ක්‍රියාවට නගනවා.

**ප්‍රජා වෛද්‍ය විශේෂඥ, මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා**
*කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ මහජන සෞඛ්‍ය අංශය*

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි උපුල් රන්ජන් වන මා විසින් මහරගම, පිළියන්දල පාර, නුගගහ පෙදෙස 43/20, ස්ථානයේ පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවන ලදී.